ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 2020-08-12

පැමිණිලි පාර්ශවය : කේ.පී.කේ ද සිල්වා මයා,
චන්දන ගුණසේකර මාවත,
බණ්ඩාරගම පාර,
කුඩාවස්කඩුව.

වගඋත්තර පාර්ශවය : 01. පො.කො 55271 සමරතුංග මයා,
පොලිස් ස්ථානය,
මොරොන්තුඩුව.

02. උ.පො.ප ගමගේ මයා,
පොලිස් ස්ථානය,
මොරොන්තුඩුව.

03. ස්ථානාධිපති,
පොලිස් ස්ථානය,
මොරොන්තුඩුව.

<u>පැමිණිලි අංකය : HRC/2304/18</u>

පැමිණිල්ල :-

ඉහත පැමිණිලිකරු විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ඉදිරියේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, පැමිණිලිකරුට එරෙහිව මොරොන්තුඩුව පොලිස් ස්ථානයේ ගොනුකර තිබූ පැමිණිල්ලක් විභාග කිරීමට අදාළව මොරොන්තුඩුව පොලිස් ස්ථානය වෙත 2018.09.08 වන දින උදෑසන 10.00 ට පමණ ගිය බවත්, පැමිණිල්ල විභාග කිරීමෙන් අනතුරුව දෙපාර්ශවය අතර සමථයක් ඇති නොවීම හේතුවෙන් තමා සිර මැදිරිය තුළට දැමූ බවත්ය. සිර මැදිරිය තුළ ප.ව 3.30 පමණ තෙක් සිටි අතර, පසුව තම මව වන වයි.එස්. ලෙස්ලින් සිල්වා යන අය පැමිණ තමාට ඇප ලබාදීමට සූදානම්

වන අවස්ථාවේදී අසල පුටු දෙකක වාඩි වී සිටි තමාත් තම මවත් අතරට එම අවස්ථාවේ පොලිස් ස්ථානයේ සිවිල් ඇඳුමින් සැරසී තීන්ත ආලේප කරමින් සිටි නිලධාරියෙකු පැමිණ තමාගේ මුහුණට පහරවල් 4 ක් පමණ එල්ල කළ බවත්, එම පහරවල් තමාගේ දතට හා ඇස ප්‍රදේශයට එල්ල වූ බවත් දන්වා ඇත. ඒ අනුව තමාට සිදුවූ මෙම අසාධාරණය සම්බන්ධයෙන් සාධාරණයක් ඉටුකර දෙන ලෙසට පැමිණිලිකරු කොමිෂන් සභාවෙන් ඉල්ලා සිට ඇත.

**වගඋත්තර පාර්ශවයේ කරුණු දැක්වීම :-**

2019.02.08 දිනැතිව මානව හිමිකම් කොමිෂන් සභාව වෙත වාර්තාවක් ඉදිරිපත් කරමින් මොරොන්තුඩුව පොලිස් ස්ථානයේ ස්ථානාධිපති සඳහන් කර ඇත්තේ, විශ්‍රාමික යුධ හමුදා නිලධාරියෙකු වන නො.14/ඒ, මහගෝනදූව, මොරොන්තුඩුව ලිපිනයේ පදිංචි සංසරංගේ දොන් චන්ද්‍රසිරි සන්දනායක යන අය විසින් මෙම කවිරත්න ප්‍රියන්ත කුමාර ද සිල්වා යන අයට විරුද්ධව 'බැන තර්ජණය කිරීමක් හා අයුතු ඇතුල්වීමක්' සම්බන්ධයෙන් 2018.08.20 වන දින පැය 20.20 ට CIB II 392/154 යටතේ පැමිණිල්ලක් කර ඇති බවයි. මෙම පැමිණිල්ල විභාග කිරීම සඳහා 2018.09.08 වන දින පොලිස් ස්ථානය වෙත දෙපාර්ශවය කැඳවා ඇති අතර, විවිධ පැමිණිලි අංශයේ ස්ථානාධිපති උ.පො.ප ගමගේ නිලධාරියා විසින් මෙම පැමිණිල්ල විභාග කර ඇති බවත්, පසුව එම නිලධාරියා විසින් CIB I 292/58 යටතේ පැය 12.15 ට කවිරත්න ප්‍රියන්ත කුමාර ද සිල්වා යන අය අත්අඩංගුවට ගෙන තිබෙන බවත් ඉන් අනතුරුව ඔහු විසින්ම අදාළ පැමිණිල්ල විභාග කර සමථයකට පත් කිරීම හේතුවෙන් එදිනම පැය 17.20ට ඇප ලබාදීමට කටයුතු කර ඇති බවත් සඳහන් කර ඇත.

**විමර්ශනයේදී අනාවරණය වී ඇති කරුණු :-**

පැමිණිලිකරු වන ඉහත නම් සඳහන් කවිරත්න ප්‍රියන්ත කුමාර ද සිල්වා යන අයට විරුද්ධව මොරොන්තුඩුව පොලිස් ස්ථානයේ CIB II 392/154 යටතේ පැමිණිල්ලක් ගොනු වී ඇති අතර, 2018.09.08 වන දින එය විභාග කිරීම සඳහා කැඳවීමක් කර ඇති බවත්, එම කැඳවීම ප්‍රකාරව මෙම පැමිණිලිකරු පොලිස් ස්ථානයට ගොස් ඇති බවත්, පැමිණිල්ල විභාගයේදී මෙම පැමිණිලිකරුව අත්අඩංගුවට ගැනීමක් සිදුකර ඇති බවත් අනාවරණය වී ඇත. නමුත් පසුව නැවත වරක් දෙපාර්ශවය අතර සාකච්ඡා කර අවසාන සමථයක් සඳහා කටයුතු කර තිබෙන බවට කරුණු අනාවරණය වන අතර, එම අවස්ථාවේදී පොලිස් ස්ථානයේ තීන්ත ආලේප කරමින් සිටි පො.කො 55271 සමරතුංග නිලධාරියා විසින් එම සාකච්ඡාවට අනවශ්‍ය මැදිහත්වීමක් සිදුකර තිබෙන බවටද අනාවරණය වේ.

මෙහිදී පැමිණිලි පාර්ශ්වය කොමිෂන් සභාව වෙත කියාසිටිනු ලබන්නේ, එම නිලධාරියා විසින් තම මුහුණ ප්‍රදේශයට පහරවල් 4 ක් පමණ එල්ල කළ බවත්, එම පහරවල් තම දතට සහ ඇස ප්‍රදේශයට එල්ල වූ බවත්ය. නමුත් ඒ සම්බන්ධව පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයාට හෝ පැමිණිල්ලක්

ඉදිරිපත් කර ඇති බවක් අනාවරණය නොවේ. කෙසේ නමුත් පැමිණිලිකරු විසින් ඒ සම්බන්ධයෙන් පොලිස්පතිවරයා වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කරන ලද බවට කොමිෂන් සභාව හමුවේ ප්‍රකාශ කර ඇත. එසේම එම පැමිණිල්ල විභාග කරන ලද උ.පො.ප ගමගේ නිලධාරියා විසින්ද පොලිස් ස්ථානය තුළදී පැමිණිලිකරුට යම් පහරදීමක් සිදුවූ බවට ලිඛිත සටහනක් ඇතුළත් කර නොමැති බව අදාළ උදෘත පොත් පරික්ෂාවේදී නිරීක්ෂනය වී ඇත.

තවද 2019.12.13 දිනැති පරීක්ෂණයේදී පො.කො 55271 සමරතුංග නිලධාරි විසින් සිය කරුණු ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ, පොලිස් ස්ථානයේ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරීතුමාගේ අධීක්ෂණයක් සිදුකිරීමට නියමිතව තිබූ බැවින් තමා එහි තීන්ත ආලේප කරමින් සිටි බවත්, මෙම පැමිණිලිකරුට අදාළ පැමිණිල්ල විභාග කරමින් සිටින අවස්ථාවේදී මෙම පැමිණිලිකරු උස් හඩින් කෑ ගසමින් සිටින විට තමා එම ස්ථානයට පැමිණ එළෙස කෑ නොගසන ලෙසට ඔහුට අවවාද කළ බවත්, පහරදීමක් නොකළ බවත්ය. මේ අනුව එම ස්ථානයේ යම් සිදුවීමක් සිදුව ඇති බවට තවදුරටත් තහවුරු වේ.

පසුව මෙම පැමිණිලිකරු 2018.09.09 වන දින නාගොඩ රෝහලට ප්‍රතිකාර ගැනිම සඳහා ඇතුළත් වී ඇති අතර, එහිදී අධිකරණ වෛද්‍ය නිලධාරියෙකු විසින් රෝගියා පරීක්ෂාවට ලක්කර ඇත. ඊට අදාළ අධිකරණ වෛද්‍ය වාර්තාව කොමිෂන් සභාව වෙත කැඳවා ඇති අතර, එම වාර්තාවට අනුව මෙම පැමිණිලිකරුගේ වම් ඇසේ පිල්ලම උඩ සෙ.මී $0.2\times0.1$ පමණ කුඩා සීරීමක් තිබෙන බවට හා වෙනත් කිසිදු තැනක බාහිර තුවාල හෝ අස්ථි බිඳීම් හෝ තැලීම් නොමැති බවටද කරුණු වාර්තා කර ඇත.

තමාට පහරදීම සිදුවූ ආකාරය ලෙස පැමිණිලිකරු දක්වා ඇත්තේ සිය මුහුණට අතින් පහරදුන් බවට වන අතර, අධිකරණ වෛද්‍ය වාර්තාවට අනුව අදාළ තුවාලය මොට ආයුධයකින් සිදුවූ තුවාලයක් වන බවද දක්වා ඇත. ඒ අනුව අධිකරණ වෛද්‍ය වාර්තාවේ කරුණු හා එම තුවාල සැසඳෙන බවද නිරික්ෂණය වේ.

තවද මෙම පැමිණිලිකරුගේ මව වන වයි.එස්.ලෙස්ලින් සිල්වා යන අය කොමිෂන් සභාව වෙත දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කර ඇති අතර, එම දිවුරුම් ප්‍රකාශයට අනුව අදාළ පැමිණිල්ල පොලිස් ස්ථානයේ උපපොලිස් පරික්ෂකතුමා විසින් විභාග කරන අවස්ථාවේදී ඒ අසල සිටි සිවිල් ඇඳුමින් සැරසුනු සමරතුංග නැමැති නිලධාරියෙකු ඒ අසලට පැමිණ තම පුතාගේ කම්මුල වෙත තදින් පහරවල් කිහිපයක් ගැසූ බවට සඳහන් කර ඇත. ඒ අනුව මෙම ඇසින් දුටු සාක්ෂිය මගින්ද පැමිණිලිකරුට පහරදීමක් සිදුව ඇති බවට සනාථ වේ.

තවද මේ පිළිබඳව මෙම පැමිණිලිකරු විසින් පානදුර සහකාර පොලිස් අධිකාරි කාර්යාලය වෙත පැමිණිල්ලක් ගොනු කර ඇති අතර, එය විභාග කර එහි වාර්තාව කොමිෂන් සභාව වෙත 2019.12.31

වන දින ඉදිරිපත් කර ඇත. එම වාර්තාවට අනුව පහරදීමක් පිළිබඳව කරුණු අනාවරණය නොවුනද යම් සිද්ධියක් සිදුවී තිබෙන බව අදාළ විමර්ශනයෙන් අනාවරණය වී තිබෙන බව සහකාර පොලිස් අධිකාරී පානදුර II ජී.ඒ.ජේ.එන් සේනාරත්න මහතා විසින් කොමිෂන් සභාව වෙත වාර්තා කර ඇත.

මෙම සමස්ත කරුණු අනුව මෙම පැමිණිලිකරු වන කවිරත්න ප්‍රියන්ත කුමාර ද සිල්වා යන අයට විරුද්ධව ගොනුකර ඇති පැමිණිල්ල සමථයක් සඳහා උ.පො.ප ගමගේ නැමැති නිලධාරියා විසින් සාකච්ඡා කරමින් සිටින අවස්ථාවේදී එම ස්ථානයට අනවශ්‍ය මැදිහත්වීමක් පො.කො 55271 සමරතුංග නිලධාරියා විසින් සිදුකර ඇති බවට කරුණු අනාවරණය වේ. එහිදී පහරදීමක් සම්බන්ධව සටහන් වී නොමැති වුවද අදාළ නිලධාරියා විසින් පහරදීමක් සිදුකර ඇති බවට ඉදිරිපත්ව ඇති කරුණු කෙරෙහි අවධානය යොමු කිරීමේදී පැහැදිලි වේ. එසේම මේ වන විට අදාළ පැමිණිලි විභාගයේදී 'අනවශ්‍ය මැදිහත්වීමක් සිදුකිරීම' හේතුවෙන් පො.කො 55271 සමරතුංග යන නිලධාරියා විනය ශාලාවට කැඳවා දඬුවම් ලබා දිමක් ලෙස මොරොන්තුඩුව පොලිස් ස්ථානයෙන් ස්ථානමාරුවීම් සිදුකර ඇති අතර, එමගින්ද එම අවස්ථාවේදී යම් සිදුවීමක් සිදුව ඇති බවට තහවුරු වේ.

මේ අනුව දෙපාර්ශවය විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති කරුණු සහ අනෙකුත් සාක්ෂි අනුව පැමිණිලිකරුට පහරදීමක් සිදුකර ඇති බවට කරුණු අනාවරණය වන අතර, එමගින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 11 වන ව්‍යවස්ථාව මගින් සහතික කොට දී ඇති පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීමක් සිදුව ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

01 පො.කො 55271 සමරතුංග නිලධාරී විසින් රු. 5,000/- ක මුදලක් පැමිණිලිකරු වෙත ගෙවිය යුතු බවට නිර්දේශ කරනු ලැබේ.

02. තවද ඉහළ නිලධාරියෙකු විසින් පැමිණිල්ලක් විභාග කරන අවස්ථාවේදී අනවශ්‍ය ලෙස පහළ නිලධාරීන් මැදිහත්වීම හා ඊට එරෙහිව ක්‍රියාමාර්ගයක් නොගැනීම සම්බන්ධයෙන් පැමිණිල්ල විභාග කරනු ලැබූ උ.පො.ප ගමගේ නැමැති නිලධාරියා සම්බන්ධයෙන්ද පොලිස්පති විසින් විනය පියවර ගත යුතු බවත් මෙයින් නිර්දේශ කරනු ලැබේ.

03. තවද 1 වන වගඋත්තරකාර පො.කො 55271 නිලධාරි සම්බන්ධයෙන්ද පොලිස්පතිවරයා විසින් විනය ක්‍රියාමාර්ග ගත යුතු බවටද මෙයින් නිර්දෙශ කර සිටිමු.

2020. 09. 18 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත මෙයින් දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

එච්. ගසාලි හුසේන්,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

රමණී මුත්තෙට්ටුවේගම,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

පිටපත :- 01. පොලිස්පති,
පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

02. සභාපති,
ජාතික පොලිස් කොමිෂන් සභාව,
බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාව,
කොළඹ 08.

සැ.යු :- අදාළ මුදල 'මුදල් ඇණවුමක්' මගින් පැමිණිලිකරු වෙත ගෙවා එහි පිටපතක් කොමිෂන් සභාව වෙත ලැබීමට සැළැස්විය යුතුය.

B/